# ප්‍රසිද්ධ වෙන්දේසියයි!

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ භාවිතයෙන් ඉවත් කරන ලද කාර්යාලයීය ගෘහභාණ්ඩ තොගයක් **2017.03.29 දින පෙ.ව. 10.00** ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මෙම ගෘහභාණ්ඩ **රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගොඩනැගිල්ලේ දෙවන මහලේ ආපන ශාලාව තුළ ගබඩා කර ඇති අතර, ඒවා 2017.03.16 දින සිට 2017.03.28 දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 3.30 දක්වා** කාලය තුළ පරීක්ෂා කර බැලිය හැකිය.

03. 2017.03.29 දින පෙ.ව. 10.00 ට අදාල වෙන්දේසිය ආරම්භ කෙරෙන අතර, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මිළ නියම කිරීමේ කමිටුව මගින් එක් එක් භාණ්ඩය සඳහා නියම කර ඇති අවම මිලෙන් ලංසු තැබීම ආරම්භ වනු ඇත.

**04.කොන්දේසි:**

- වෙන්දේසියේදී නියම වන උපරිම මිළට අදාල භාණ්ඩය අලෙවි කෙරෙන අතර, ගැනුම්කරු එම අවස්ථාවේදීම නියමිත මුදල රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ සරප් වෙත ගෙවා නියමිත කුවිතාන්සිය ලබා ගත යුතුය.
- භාණ්ඩය වෙන්දේසි කළ පසුව භාණ්ඩයේ වගකීම මිලදී ගනු ලබන පුද්ගලයා සතු වේ.
- **වෙන්දේසිය පැවති දින සිට රජයේ වැඩ කරන දින 02 ක් ඇතුළත අදාල භාණ්ඩ දෙපාර්තමේන්තු පරිශ්‍රයෙන් ඉවත් කර ගත යුතු අතර ප්‍රමාද වන සෑම දිනක් සඳහාම ප්‍රමාද ගාස්තු අය කරනු ඇත.**
- මෙම වෙන්දේසිය සම්බන්ධ සියළු බලතල රජයේ මුද්‍රණාලයාධිපති සතු වන අතර, රජයේ මුද්‍රණාලයාධිපති විසින් අවස්ථානුකූලව උද්ගතවන තත්වයන්හිදී ගනු ලබන තීරණය අවසන් තීරණය වේ.

ගංගානි ලියනගේ

රජයේ මුද්‍රණාලයාධිපති

2017.03.16 දින

කොළඹ 08,

දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවතේ,

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේදිය.